# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## S10 දුම්රිය මැදිරි 30ක අන්තර් මධ්‍ය අලුත්වැඩියාවන් හා පින්තාරු කිරීම් සඳහා ප්‍රසම්පාදනය

## SRS/F. 7894

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති, විසින් දේශීය නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් ශ්‍රී ලංකා දුම්රියට සේවයට S10 දුම්රිය මැදිරි 30ක අන්තර් මධ්‍ය අලුත්වැඩියාවන් හා පින්තාරු කිරීම් සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීමත් පහත සඳහන් ලිපිනයේදී, රාජකාරී දිනවල 2023.10.31 දින සිට 2023.11.23 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ සිදුකළ හැක.

04. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),

**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඔල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන** | **: 94(11)2438078 හෝ 94(11)2436818** |
| **ෆැක්ස්** | **: 94(11)2432044** |
| **ඊමේල්** | **: dgmp@railways.gov.lk.potl@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | **: www.railway.gov.lk** |

05. ලංසුකරු විසින්, බර ලෝහ පිරිසැකසුම හා මගී වාහන අභ්‍යන්තර ඉදිකිරීම් සඳහා ශක්‍යතාව හා හැකියාව සහ බර ලෝහ පිරිසැකසුම හෝ ෆර්නිෂින්ග් (Furnishing) වැඩ සඳහා ISO 9001:2008 තත්ත්ව සහතිකය හෝ සමාන සහතික තමන් සතු බව තහවුරු කරලීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

06. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රු. 32,000/- ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඔල්කට් මාවතේ, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2023.10.31 දින සිට 2023.11.23 දින ප.ව. 3.00 දක්වා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් උකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛණ කට්ටලයක් මිළදී ගත හැක.

07. සියලුම ලංසු සමාගම රුපියල් 1,800,000.00 වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

08. පූර්ව- ලංසු රැස්වීම, 2023.11.15 දින රත්මලාන, යාන්ත්‍රික උප දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේදී පැවැත්වේ.

09. ලංසු පහත සඳහන් ලිපිනය වෙත, 2023.11.24 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලැබී ඇති ලංසු අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඔල්කට් මාවත, කොළඹ 10.**
**යොමු අංකය : SRS/F.7894**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (ප්‍රධාන)**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**